


# අහෝ ටෙලි නාට්‍ය !

ශ්‍රී ලංකාවේ තරම් ටෙලිනාට්‍ය නිශ්පාදනය වන රටක් දකුණු ආසියවේම ඇද්දැයි මට මොහොතකට සිතේ. එය එපමණටම වැඩි ප්‍රමාණාත්මක අගයක් ගනී. මෙම තත්වය කර්මාන්තයක් ලෙස අප සතුටු විය යුතු වර්ධනයක් නොවේදැයි යමෙකු මගෙන් විමසුවහොත් මම ඊට හිස නමා එකඟවෙමි. අධ්‍යක්‍ෂකවරුන්, නළු නිළියන්, කාර්මික ශිල්පීන් ඇතුළු කර්මාන්තගත ශ්‍රම බලකාය වැඩි වී තිබේ. ටෙලි නාට්‍ය දෙක තුනක රඟපෑ පමණින් ඕනෑම නළුවකුට එක් රැයකින් අධ්‍යක්‍ෂකවරයෙකු ලෙස සිය රූපාන්තරණය සකසා ගත හැකි තරමට ක්‍ෂේත්‍රය ලිබරල් වී තිබේ. ආර්ථික විද්‍යා න්‍යායට අනුව එහි ආබාධ පිවිසුමක් හා ආබාධ පිටවුමක් නිර්මාණය වී තිබේ. නිර්මාණය වන ඕනෑම බාල ටෙලි කතාවක් විකාශය කිරීමට දිවා රෑ පෙළගැසී සිටින රූපවාහිනී නාලිකා ප්‍රමාණයද දිනෙන් දින ඉහළ යනු පෙනේ. මෙම නව ලිබරල් යාන්ත්‍රණය තුළ ටෙලිනාට්‍ය කර්මාන්තයේ ගුණාත්මක මුහුණුවර කෙබඳු ? අප අභිමුව ඇති ගැටළුව එයයි.

අනෙක් පසින් ඉන්දියාවෙන් ආනයනය කරන ලද ටෙලි නාට්‍ය රැල්ලක්ද ශ්‍රී ලාංකික ප්‍රේක්ෂක ආලින්දනයට දරුණු ලෙස ඇබ්බැහි කොට තිබේ. නම් වලින් කියැවෙන ඉන්දීය ටෙලිනාට්‍ය ඉහත කී ලිබරල් නිදහසින් රිංගා පැමිණි රෝග කාරක වේ. මෙම ටෙලිනාට්‍ය ප්‍රේක්ෂකයා වෙත උසස් රසවින්දනයක් ලබා දෙන්නේ නම් අප සතුටු විය යුතුය. එහෙත් සිදුවන්නේ එය නොවේ. ඉන්දීය ඉහළ මධ්‍යම පාන්තික ජීවිතය අතිශය ග්‍රාම්‍ය ලෙස නිරූපිත ටෙලි කතා රැල්ලක් සංගතයක් ලෙස බෝවී ප්‍රේක්‍ෂක රස වින්දනය ලෙඩ කිරීමයි. සාර්ථක ලෙස හඬ කැවූ "ඔෂීන්" වැනි ගුණාත්මක බවින් ඉහළ ටෙලි කතා රස විඳි අප ප්‍රේක්‍ෂක ජනතාවගේ රසවින්දනය ආපස්සට ඇදගෙන යමින් තිබේ. මේක විකාශනය කරන මාධ්‍ය ආයතන සිය ලාභ මල්ල ගැන සිතනු විනා ප්‍රේක්‍ෂක වින්දනය ඉහළ දැමීම සහමුලින්ම අමතක කොට ඇත.

අද ශ්‍රී ලංකාව තුළ නිපදවන බොහොමයක් ටෙලි නාට්‍ය සඳහා නමක් දැමීම පවා දුෂ්කර කටයුත්තක් වී ඇති බව පෙනේ. බොහෝ ටෙලි නාට්‍ය සඳහා යොදන නම් එකිනෙකට සමාන බවක් දක්වයි. බැලු-නොබැලු කතා මොනවාද යන්න මතකයට නගාගත නොහැකිව ප්‍රේක්‍ෂකයා අතරමං වන තරමට තත්වය සංකීර්ණ වී තිබේ. එක්කෝ මේ කතා වල අන්තර්ගතය එකහා සමාන වීම මීට හේතුව විය යුතුය. නැතිනම් උග්‍ර නම් හිඟයකින් ක්‍ෂේත්‍රය පීඩා විඳිය යුතුය.

මෙම ටෙලි නාට්‍ය සඳහා පාදක වන අද්දැකීම් ක්‍ෂේත්‍රය පිළිබඳ අප තුළ ඇත්තේ නොසතුටකි. සියවස් ගණනක සිට අප සතුව පවතින විශිෂ්ඨ භාවමය හා ඥාණමය සම්පත් සොයා පාදා ගනු වෙනුවට අප සමාජ ජීවිතය තුළ පවතින පරාධීන මනෝභාවයන් අතිශය ග්‍රාම්‍ය ලෙස ටෙලි කැමරාවට හසුකර ගැනීමේ පහසු කාර්යය ජයටම සිදුවෙමින් තිබේ. අනෙක් පසින් ඒකාකාරී ප්‍රේම විලාප රැගත් වට්ටෝරුගත ටෙලි කතා අප ආලින්දය මත ගිගුම් දේ. මෙම අන්ත දෙනෙක් මිදී වඩාත් නිර්මාණාත්මක තෙවැනි ඇසක් සහිත ටෙලි රූප පෙළක් අප හමුවට එන්නේ කලාතුරකිනි. එය කැමරාවක් තිබූ පමණින් කළ හැක්කක් නොවේ. ඒ සඳහා අදාල මාධ්‍ය පිළිබඳ සැළකිය යුතු දැනුමක් හා විරල පරිකල්පන ශක්තියක් අවශ්‍ය වේ. එම දැනුම හා නිර්මාණාත්මක කුසලතාව එක රැයකින් ලබාගත හැකි යයි සිතීම මුලාවක් බවට අද නිපදවන බොහෝමයක් ටෙලි නාට්‍ය කදිම නිදසුනක් සපයයි.

පහසුවෙන් කළ හැකි ඒකාකාරී ටෙලි කතා "මාකට්" කිරීමේ ලිබරල් පිළිවෙතට බොහෝ පිරිස් අතගසන්නේ ඔවුන් සතු කුසලතාවන්ගේ ඌනතාවය නිසාද ? නොහොත් ප්‍රසස්ත නිර්මාණ "මාකට්" කළ නොහැකි නිසාද ? ඒ ඉහත පළමුවන හේතුව නිසා බව මගේ හැඟීමයි. "මාකට්" කිරීම සඳහා එකී නිර්මාණාත්මක දැනුම පරිහරණය කළ නොහැක්කේ ඇයි ? හොඳ නිර්මාණයක් ප්‍රේක්‍ෂකයා වෙත ගෙනයාම සඳහා දියුණු වෙළඳපොළ උපක්‍රම පරිහරණය කළ නොහැකි යයි මම නොසිතමි. ඊට අපේක්ෂිත රසික සමාජය ඇමතිය හැකි "ඉවක්" හා "ශිල්පීය ඥාණයක්" අවශ්‍ය වේ. හොඳ නිර්මාණ කළ හැකි නම් සේවා "මාකට්" කිරීම එතරම් ගැටලුවක් නොවේ. පළමුව කළ යුත්තේ හොඳ නිමැවුමකට උරදීමයි. අපගේ ටෙලි නාට්‍ය කර්මාන්තය අභ්‍යන්තරයේ ඇතිවිය යුතු ධනාත්මක සුසංවර්ධනය එයයි. යශෝරාවය, ගේ කුරුල්ලෝ, වෙද හාමිනේ, දියකැට පහණ, දඬුබස්නා මානය, වැනි (මේ මා මතකයට නැගුනු හොඳ ටෙලි නිර්මාණ කිහිපයක් පමණි.) ටෙලි නාට්‍ය අප මතකයෙන් බැහැර නොවී පවතින්නේ එම නිර්මාණ සතු සාර්ථකත්වය නිසාවෙනි. එම නිර්මාණ බිහිකිරීමට උරදුන් නිර්මාණකරුවන් එක් රැයකින් පහල වූවන් නොවේ. එය දිගු අභ්‍යාස කාලයක කැපවීමක අවිච්චින්න පලයකි. ඔවුන් සිය නිර්මාණ තුළින් විසල් රසික පර්ෂදයකට ආමන්ත්‍රණය කළ අතර සාර්ථක ශ්‍රව්‍ය-දෘෂ්‍ය ටෙලි අත්දැකීමක ප්‍රහර්ෂය විඳ ගැනීමට එමගින් එම රසිකයිනට අවකාශය උදාවුණි.

තතු එසේ වුවද අද ශ්‍රී ලංකාවේ සිට මෙරටට ආනයනය කරනු ලදුව අප ශ්‍රී ලාංකික වෙළඳසැළකින් කුලියට ගෙන නරඹන ටෙලි නාට්‍ය බොහොමයක් අපට ලබා දෙන්නේ කුමක්ද? දියුණු රසවින්දනයක්ද ? සැබවින්ම නැත. එමගින් සිදුවන්නේ වටිනා විවේකය අරුත්සුන් කිරීමක් බව මගේ හැඟීමයි. අනෙක් අතින් ඔස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික රසිකයින් මෙම ටෙලිනාට්‍ය නැරඹීමට වඩා ප්‍රිය කරන වෙනත් හේතුවක් ඇතැයි මට සිතේ. ශ්‍රී ලාංකික සමාජය තමනට දුරස් වීම තුළින් ඇතිකොට තිබෙන කියාගත නොහැකි සංකාව සමනය කරගැනීමට මෙමගින් පිහිටක් සොයනවා විය හැකිය. ඔවුන් මෙම ටෙලි නාට්‍ය තුලින් දකින අඳුනන ගහවැල පාර තොට දකිති. ඉන් භෞතිකව ශ්‍රී ලාංකික සමාජයත්, හිත මිතුරනුත් දුරස් වීමෙන් ලබන මානසික වියවුලට අවිඥානව තාවකාලික සහනයක් අපේක්‍ෂා කරනවා විය හැකිය. ඉන් ඔබ්බට ගිය කලාත්මක රසවින්දනයක් මෙම ටෙලිනාට්‍ය තුලින් ලබාගැනීම දුෂ්කරය.

රවී සිරිවර්ධන

ravi.siriwaradhana@gmail.com


ඔබේ සොඳුරු මංගල දිනයේ



ඔබේ සොඳුරු මංගල දිනයේ
අපේ සම්ප්‍රදායික රටාවෙන් හා
නවීන විලාසිතාවෙන්
පිරිපුන් මනාලියක දක්වා හැඩ වීමට

මනාලියන්ගේ මල් කළඹ සැකසීම

ඔබේ සියලුම රූපලාවන්‍ය කටයුතු
එකම තැනකදී පහසු මිලකට

- කාන්තා කොණ්ඩා කැපීම හා කොණ්ඩා මෝස්තර
- ෆර්ම් කිරීම ස්ට්‍රේට් කිරීම කලර් කිරීම
- ටින්ට් කිරීම රිබොන්ඩිං කිරීම
- ෆේෂල් කිරීම වැක්ස් කිරීම
- ත්‍රෙඩින් කිරීම මුහුණ බ්ලීච් කිරීම සම බ්ලීච් කිරීම ඇතුලු සියලුම රූපලාවන්‍ය කටයුතු සඳහා

දස වසරක පළපුරුද්ද සමගින්
උසස් ඩිප්ලෝමාධාරිණී

**ප්‍රෂානි සුරවීර**

*Salon Colour Box*

14 Winterton Close
Epping
**TP 9401 3727 / 0425 805 754**



**GATEWAY LAWYERS**

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila